විභාග, විභාග ප්‍රතිඵල ආදිය

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

වයඹ පළාත් සභා කළමනාකරණ සේවා නිලධාරී සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

වයඹ පළාත් සභා කළමනාකරණ සේවා නිලධාරී සේවයේ III ශ්‍රේණියේ පවතින පුරප්පාඩු **239** ක් සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම් ලත් වයඹ පළාතේ ස්ථිර පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් **2026 දෙසැම්බර් මස** පවත්වන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. ඒ සඳහා වන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ **www.doenets.lk** වෙබ් අඩවියේ පළකර ඇති අතර, අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත (Online) ක්‍රමයට පමණි.

සැලකිය යුතුයි :

මෙම විභාගය ඒකාබද්ධ රාජ්‍ය සේවයේ කළමනාකරණ සේවා නිලධාරී සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය හා ඒකාබද්ධව එක් විභාගයක් ලෙස පැවැත්වෙන අතර, සේවාවන් දෙකටම සුදුසුකම් ලබන අයදුම්කරුවන් හට සිය මනාපය පරිදි එක් සේවාවක් තෝරා ගැනීමට අවස්ථාව සලසා දෙනු ලැබේ.

සටහන - **මාර්ගගතව අයදුම්පත් භාරගැනීම 2026 නොවැම්බර් මස 02 වැනි දින පෙ.ව. 9.00 ට විවෘත වන අතර, 2026 නොවැම්බර් මස 15 වැනි දින ප.ව 9.00 ට අවසන් වේ.**

02. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 අනුව වයඹ පළාතට අයත් දිස්ත්‍රික් ජනගහන අනුපාත පදනමින් වයඹ පළාත් සභා කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා පත් කිරීමට තෝරා ගනු ඇත.

03. පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ. මෙම විභාගය පැවැත්වීම, අවලංගු කිරීම, කල් දැමීම හෝ කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම පිරවීම හෝ නොපිරවීම හෝ මේ පිළිබඳව අවසාන තීරණය ගැනීමේ බලය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

පත්වීමක් සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවා අවශ්‍යතාවය පරිදි වයඹ පළාත් සභා බල ප්‍රදේශය තුළ පිහිටි ඕනෑම සේවා ස්ථානයක සේවය කිරීමට පත්වීම්ලාභීන් බැඳී සිටී.

04. **වැටුප් පරිමාණය :**

අංක 10/2025 හා 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව, කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III, II, හා I වැනි ශ්‍රේණිවලට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 48,470 - 10 x 540, 11 x 630 - 10 x 1,010 - 10 x 1,190 - රු. 82,800/ ක් වේ. ඉහත චක්‍රලේඛය අනුව වැටුප් ගෙවනු ලැබේ. (රු. 53, 870 න් ඔබ්බට යාම සඳහා II වැනි ශ්‍රේණියට උසස්වීම ද, රු. 60, 800 න් ඔබ්බට යාම සඳහා I වැනි ශ්‍රේණියට උසස් වීම ද ලබා ගත යුතුය.)

05. මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තව ද ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය.

5.1 මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත්ය. වයඹ පළාත් සභා රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවාගෙන වසර 03 ක් ඇතුළත සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

5.2 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 ට අනුව හා ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව සේවයට බැඳී වසර 03 ක් ඇතුළත සේවයට බැඳුණ භාෂා මාධ්‍යයට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව / භාෂා පිළිබඳ ප්‍රවීණතාව ලබාගත යුතුය.

06. **සුදුසුකම් :** වයඹ පළාත් සභා කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අදාළ වේ.

6.1 අයදුම්පත් කැඳවන අවසන් දිනට වයඹ පළාත් සභා බල ප්‍රදේශය තුළ අවම වශයෙන් වසර තුනක් (03) ස්ථිර පදිංචිය ඇති ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

6.2 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු දහ අට (18) ට නොඅඩු හා අවුරුදු තිහට (30) නොවැඩි විය යුතුය.

6.3 යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

6.4 පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු ය :-

(අ) සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමර්ථ්‍යයන් සහිතව එක්වරකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් ව තිබීම ;

සහ

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර) එකවර සමත්ව තිබීම. පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් 03 කින් එක්වර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.

සටහන :

1. **අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සම්මාන සාමර්ථ්‍යක් ලබා තිබිය යුතු භාෂාව ලෙස සලකනු ලබන්නේ අයදුම්කරු මෙම තරග විභාගය සඳහා ඉදිරිපත් වන භාෂා මාධ්‍යය වේ.**

2. **සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.**

07. 7.1 **දිස්ත්‍රික් ජනගහන අනුපාත පදනම මත තෝරා ගැනීම :**

සේවයට බඳවා ගැනීම නියෝජනාත්මක පදනමක් මත කෙරෙනු ඇත. වයඹ පළාත් සභා බල ප්‍රදේශයට අයත් එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයක ජන සංඛ්‍යාවට සමානුපාතිකව එම එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය සඳහා පුරප්පාඩු සංඛ්‍යාවෙන් නියමිත ගණනක් වෙන් කරනු ලැබේ. යම් දිස්ත්‍රික්කයකින් පිරවිය යුතු පුරප්පාඩු සංඛ්‍යාව සඳහා තරග කිරීමට සුදුස්සන් වනුයේ එම දිස්ත්‍රික්කයෙන් ඉල්ලුම් කරන අයදුම්කරුවන් පමණි :

(අ) යම් දිස්ත්‍රික්කයකට ඉහත සඳහන් පරිදි වෙන් කළ පුරප්පාඩු සංඛ්‍යාව එම දිස්ත්‍රික්කය සඳහා ඉල්ලුම් කරන ලද සුදුසුකම් සපුරාලන ලද අයදුම්කරුවන්ගෙන් පිරවිය නොහැකි අවස්ථා වලදී එම පුරප්පාඩු සංඛ්‍යාව යාබද දිස්ත්‍රික්කයට ලබා දෙනු ඇත.

සටහන :

දිස්ත්‍රික් පදනමින් බඳවා ගනු ලැබුවද, පත්වීම්ලාභීන් සේවා අවශ්‍යතාව මත වයඹ පළාත තුළ ඕනෑම සේවා ස්ථානයකට ස්ථාන ගත කරනු ලැබිය හැකිය.

7.2 **දිස්ත්‍රික්කයකට අයත් වීම සඳහා තිබිය යුතු සුදුසුකම්:** දිස්ත්‍රික්කයක පුරප්පාඩු සඳහා ඉල්ලුම් කිරීමට නම් අපේක්ෂකයා පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය :-

(අ) විභාගය සඳහා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු අවසන් දිනයට පූර්වයෙන් වූ අවුරුදු පහක් (05) ඇතුළත එම දිස්ත්‍රික්කය තුළ අවම වශයෙන් අඛණ්ඩව අවුරුදු තුනක් (03) ක් ස්ථිර වශයෙන් පදිංචිව සිටි අයකු විය යුතුය.

7.3 අයදුම්කරුවන් ඉහත පරිදි තමන් අයත්වන දිස්ත්‍රික්කය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද DS 04 පදිංචි සහතිකය ඉල්ලා සිටින අවස්ථාවක ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

සටහන:

1. කිසිම අපේක්ෂකයකුට එක් දිස්ත්‍රික්කයකට වැඩි ගණනක පුරප්පාඩු සඳහා තරග කිරීමට අවසර දෙනු නොලැබේ. තමන් වඩාත් කැමති දිස්ත්‍රික්කය කවරක් දැයි වරක් සඳහන් කළ පසු එය වෙනස් කළ නොහැකිය.

08. **විභාග පටිපාටිය :**

8.1 මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යවලින් පැවැත්වේ. අයදුම්කරු තමාට අදාළ එක් මාධ්‍යයක් තෝරා ගත යුතු අතර, විභාගයට නියමිත සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා එම මාධ්‍යයෙන්ම පිළිතුරු සැපයිය යුතුය. ඉල්ලුම් කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

මෙම විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වේ.

	ප්‍රශ්න පත්‍රය	*කාලය*	*ලකුණු*
(01)	භාෂා හැකියාව	පැය 02 1/2	100
(02)	අභියෝග්‍යතාවය	පැය 01	100

8.2 **විෂයය නිර්දේශයන්:-**

භාෂා හැකියාව :

මෙම ප්‍රශ්න පත්‍රය අයදුම්කරුවන්ගේ අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය, භාෂාව හා රචනය, දෙන ලද ලිපියක් කෙටුම්පත් කිරීම, සපයා ඇති දත්ත අනුව ප්‍රස්තාර වගු සකස් කිරීම, දී ඇති පාඨ සාරාංශ කිරීම, දී ඇති වාක්‍ය කිහිපයක අදහස් තනි වාක්‍යයකින් ලිවීම සහ සරල ව්‍යාකරණ භාවිතය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

අභියෝග්‍යතාවය :

මෙම ප්‍රශ්න පත්‍රය අයදුම්කරුවන්ගේ සංඛ්‍යාමය හැකියාව, තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය ආදිය මැනෙන අයුරින් සැකසෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ. බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින් යුක්ත වන අතර, ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

සටහන :

I. රාජකාරි කටයුතු සඳහා අයදුම්කරුවන්ගේ සුදුසුකම් හා හැකියා පරීක්ෂා කිරීම පිණිස මෙම ප්‍රශ්න පත්‍ර සකස් කෙරේ.

II. සෑම ලිඛිත පිළිතුරු පත්‍ර සම්බන්ධයෙන්ම අපැහැදිලි අත් අකුරු හා වචනවල අක්ෂර වින්‍යාසය පිළිබඳ වැරදි සම්බන්ධයෙන් ලකුණු අඩු කරනු ලැබේ.

මෙම විභාගය තරග විභාගයක් වුව ද පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා එක් එක් විෂයය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් අවම වශයෙන් සියයට හතළිහක් බැගින් වත් (40%) අයදුම්කරුවන් විසින් ලබා ගත යුතු අතර, විභාගයේ මුළු ලකුණු ගණනින් අවම වශයෙන් සියයට පනහක් වත් (50%) ලබා ගත යුතු වේ. තරග විභාගය සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබා ගත් ලකුණු අනුපිළිවෙළ තරයේ ම අනුගමනය කරමින් පත් වීම් දෙනු ලැබේ.

සටහන - **අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා ගැසට් නිවේදනය අනුව සුදුසුකම් තිබේ දැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.**

09. **අයදුම් කිරීමේ ක්‍රමය :-**

9.1 මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් සම්පූර්ණ කළ යුතුය. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති පොදු උපදෙස් පත්‍රිකාව (Common Instructions) බාගත කර, කියවා, අයදුම්පත පිරවීමේදී එම උපදෙස් නිවැරදිව පිළිපැදිය යුතුය. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9.2 **මාර්ගගතව යොමු කරනු ලබන අයදුම්පත්‍රයේ දෘඩ පිටපත බාගත කරගෙන තමන් සන්තකයේ තබා ගත යුතුය. අයදුම්කරු සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබුවේ නම් එම අවස්ථාවේදී නම සහතික කරගත් අයදුම්පතෙහි දෘඩ පිටපත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු වේ. අයදුම්පත්‍රය අස්ථානගත වුවහොත් සිදුවන පාඩුව අයදුම්කරු විසින් විඳදරා ගත යුතුය.**

10. **විභාග ගාස්තු :-** විභාග ගාස්තුව රුපියල් 600/- ක් වන අතර විභාග ගාස්තු ගෙවීම මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත දැක්වෙන ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් සිදු කළ යුතුය.

I. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මඟින් (Any Bank Credit Card)
II. ඕනෑම බැංකු හර කාඩ්පතක් මඟින් (Any Bank Debit Card)
III. ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රම මඟින් / Flex යෙදවුම (Bank of Ceylon Online Banking Method / Flex App)
IV. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මඟින් (Bank of Ceylon Teller Slip Payment)

සටහන - ඉහත ක්‍රම මඟින් ගෙවීම් සිදු කරනු ලබන ආකාරය පිළිබඳ උපදෙස් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

10.1 ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මඟින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදල ම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් විභාග දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ.

10.2 විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කරනු නොලැබේ.

10.3 මෙම විභාග නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව සඳහන් කරමින් වෙබ් නිවේදනයක් මඟින් /අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මඟින් දන්වනු ලැබේ.

තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් වෙබ් නිවේදනයේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතුය. විභාග ශාලාවේදී / සම්මුඛ පරීක්ෂණයේදී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

10.4 මෙම තරග විභාගය මඟින් සම්පූර්ණ කිරීමට නියමිත පුරප්පාඩු සංඛ්‍යාවෙන් 3% ක් ආබාධ සහිත පුද්ගලයන් සඳහා වෙන් කෙරෙනු ඇත. විභාගයේදී සුදුසුකම් ලබන ආබාධිත අයදුම්කරුවන් අතරින් ඉහළ ලකුණු මට්ටමේ 3% ක ප්‍රතිශතයක් පමණක් කුසලතා අනුපිළිවෙල අනුව පත්වීම් ලබා දීම සඳහා තෝරා ගැනෙනු ඇත. මේ සඳහා සුදුසුකම් ලැබීමට විභාගයේ එක් එක් විෂයය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් අවම වශයෙන් සියයට හතළිහක් බැගින් වත් (40%) අයදුම්කරුවන් විසින් ලබා ගත යුතු අතර, විභාගයේ මුළු ලකුණු ගණනින් අවම වශයෙන් සියයට පනහක් වත් (50%) ලබා ගත යුතු වේ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 27/88 හි විධිවිධාන අනුව, ආබාධිත තත්ත්වය ඔවුන්ගේ කටයුතු වලට බාධාවක් නොවන, ආබාධිත පුද්ගලයින්ගෙන් බඳවා ගැනීම සිදුකරනු ලබයි.

සටහන - මාර්ගගතව අයදුම් කිරීමේදී තමා ආබාධිත කොන්දේසි යටතේ අයදුම් කරන බව සඳහන් කළ යුතු අතර අදාළ වෛද්‍ය සහතිකවල පිටපත් අයදුම්පතේ මුද්‍රිත පිටපතක් සමඟ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය.ආබාධිත නොවන අයකු සාවද්‍ය ලෙස ආබාධිත යැයි සඳහන් නො කළ යුතුය.

11. **විභාගයට ඇතුළත් කර ගැනීම :-**

11.1 බාගත කරගන්නා ලද අයදුම්පත්‍රයේ දෘඩ පිටපත ළඟ තබා ගැනීම අනිවාර්ය වේ.

11.2 අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයකුම නියමිත විභාග ශාලාවට තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය පළමුවෙන්ම එම ශාලාවේ පෙනී සිටින දින එහි විභාග ශාලාධිපතිට භාරදිය යුතුය. සෑම විභාග අපේක්ෂකයකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් රජයේ ගැසට් පත්‍රයේ පළ කර ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත.

සටහන :- තරග විභාගයකට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් ලැබීම අයදුම්කරු මෙම තනතුරෙහි පත්වීමක් ලැබීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

12. **විභාගය පැවැත්වීමට යෝජිත නගර හා නගර අංක :-**

නගරය	*නගර අංකය*
කුරුණෑගල	01
කුලියාපිටිය	02
මහව	03
හලාවත	04
පුත්තලම	05

සැ.යු. -

1. විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කළ නගර පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. යම් නගරයකට ඉල්ලුම් කළ අයදුම්කරුවන් ගණන ප්‍රමාණවත් නොවේ නම් දෙවන කැමැත්ත ලෙස සඳහන් කළ නගරය වෙත යොමු කරන අතර, එම දෙවන නගරය සඳහා ද ප්‍රමාණවත් අයදුම්කරුවන් ගණනක් නොසිටියහොත් යාබද නගරයක් වෙත යොමු කරනු ලැබේ. කිසියම් ආකාරයකින් එවිට ද විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීමට ප්‍රමාණවත් අයදුම්කරුවන් පිරිසක් නොමැති නම් ආසන්න වෙනත් විභාග මධ්‍යස්ථානයක් වෙත ඔවුන් යොමු කරනු ඇත.

2. තෝරා ගන්නා අයදුම්කරුවන් වෙත පත්වීම් නිකුත් කරනු ලබන්නේ අයදුම්පත්‍රයේ සටහන් කරනු ලබන මූලකුරු සමඟ නමට පමණක් වන බැවින් මාර්ගගත අයදුම්පත්‍රයේ සඳහන් ආදර්ශය අනුගමනය කරමින් නම නිවැරදිව ඇතුළත් කළ යුතුය. පත්වීම් නිකුත් කරනු ලබන අවස්ථාවේ නමෙහි සංශෝධනයක් කිරීමට හෝ යම් කොටස් ඇතුළත් කිරීමට/ඉවත් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

13. **අපේක්ෂකයන්ගේ අනන්‍යතාව :-**

විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ.

I. ජාතික හැඳුනුම්පත.
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය.
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව සනාථ කර ගත හැකිවන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳ නොමැති බව සනාථ කරගත හැකි වන ලෙස දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගත යුතුය. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

14. **අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :-**

විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය.කිසියම් රාජ්‍ය ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී , රජයේ පාසලක ප්‍රධානියකු , සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතීඥවරයකු , ප්‍රසිද්ධ නොතාරිස්වරයකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන්වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

15. **ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් :-**

ඉල්ලුම් පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මේ විභාගයේ නීති රීති අනුව යම් අයදුම්කරුවකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ හෝ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

16. **විභාග ප්‍රතිඵල:-**

මෙම නිවේදනයේ සඳහන් පරිදි ලිඛිත පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන්ගේ මුළු ලකුණු කුසලතාව මත සකස් කළ ප්‍රතිඵල ලේඛනය **"ලේකම්, වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව"** වෙත ලබා දෙනු ඇත. අනතුරුව විභාගයට පෙනී සිටින සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ **www.results.exam.gov.lk** වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කරනු ඇත.

17. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට අයදුම්කරුවන් යටත් වේ. එම නීති උල්ලංඝනය කළ හොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

මෙම විභාගය පැවැත්වීම, පත්වීම් ලබාදීම හා අනෙකුත් සියලුම කරුණු සහ මෙම නිවේදනයේ විධි විධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද අවසන් තීරණය වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමා සතු වන්නේය.

18. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

එන්. එම්. ජේ. ප්‍රනාන්දු,
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.